(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 86.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2011 අප්‍රේල් මස 27 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0456/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කොළඹ නගරය තුළ තිබූ පදික වෙළෙඳුන් සතු සියලුම වෙළෙඳසැල් කඩා දැමීමේ වැඩ පිළිවෙළක් රජය ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) ඒවා ඉවත් කරන ලද දිනය සහ ඒවා ඉවත් කළේ කුමන හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සියලුම වෙළෙඳසැල් මේ වන විට සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබේද;

(ii) නොඑසේ නම්, ඒවා ඉවත් කිරීමට පියවර ගන්නේද;

(iii) තවමත් වෙළෙඳසැල් පවත්වාගෙන යන පදික වෙළෙඳුන් සිටින්නේ නම්, එම වෙළඳාම නීත්‍යානුකූල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉවත් කරන ලද පදික වෙළෙඳුන් සංඛ්‍යාව කවරේද;

(ii) ඔවුන්ට විකල්ප ස්ථාන ලබා දී තිබේද;

(iii) ඔවුන්ගේ නම් සහ ඔවුන්ට ලබාදී ඇති විකල්ප ස්ථාන කවරේද;

(iv) කොළඹ නගරය හැර වෙනත් ප්‍රදේශවලත් මෙම ගැටලුව පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) දේශපාලන පළිගැනීමක් සඳහා මෙය සිදුකළ බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මගනැගුම යන්ත්‍රෝපකරණ හා ඉදිකිරීම් සමාගමේ සභාපතිවරයා පත් කළ බලධාරියා කවුරුන්ද;

(ii) එම සභාපතිවරයාගේ වයස කොපමණද;

(iii) ඔහු මෙයට පෙර සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;

(iv) ඔහුගේ වෘත්තීය පලපුරුද්ද කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0800/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) දැනට ක්‍රියාත්මක වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දාහතකින් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හා සීමාවාසික පුහුණුව සාර්ථකව නිමකළ, මෙතෙක් ගුරු පත්වීම් නොලැබූ ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් විශාල පිරිසක් සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 දෙසැම්බර් සිට මේ දක්වා ගුරු පත්වීම් නොලබා සිටින එම ඩිප්ලෝමාධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා පත්වීම් ලබාදීමේ ක්‍රමවේදයක් මේ වන විට සකසා තිබේද;

(iii) එසේ නම්, 2010 හා 2011 වර්ෂ තුළ පත්වීම් ලබා දෙනු ලබන ගුරු සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2010 හා 2011 වර්ෂවලදී එම පත්වීම් ලබා දෙන දින වකවානු කවරේද;

(v) එම පත්වීම් ලබා දීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, 2010 හා 2011 වර්ෂ සඳහා වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම ප්‍රතිපාදනයන් වෙන්කරන ලද වැය ශීර්ෂ හා ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0968/'10

4.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජලය ලබාදෙන ප්‍රදේශ කවරේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජල විදුලි බලාගාරයක් ඉදිකරනු ලබන්නේද;

(iv) එසේ නම්, එහි විදුලි ජනන ධාරිතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපහුව ආසනය තුළ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වලට ඉහත යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0988/'10

5.

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය සේවකයන් වෙත නිවාස ලබාදීම සඳහා "නිල සෙවන" නමින් නිවාස ව්‍යාපෘතියක් රාගම නගරය ආශ්‍රිතව ඉදිකිරීමට පියවර ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එය ආරම්භ කළ දිනය කවරේද;

(iii) යෝජිත නිවාස ව්‍යාපෘතිය මගින් ඉදිකිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර ඇත්නම්, මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කවරේද;

(v) එකී නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1007/'10

6.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ පාසල් පද්ධතිය තුළ සිටින වැඩ බලන විදුහල්පතිවරුගේ සංඛ්‍යාව කොපමණද:

(ii) වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල්වල විදුහල්පතීන් ලෙස සේවය කිරීම සඳහා සුදුසුකම් ඇති, අධ්‍යාපන පරිපාලන සේවා විභාගය සමත්ව සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) ඊට අමතරව ඉහත පාසල්වල විදුහල්පති තනතුරු දැරීමට සුදුසුකම් ඇති, විදුහල්පති ශ්‍රේණීන් සමත්ව සිටින විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම විදුලහල්පතිවරු එම තනතුරු සඳහා පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින තුළ ඇති ඉසුරු පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) නවෝද්‍යා පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සඳහා පසුගිය වර්ෂ පහ තුළ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයඹ පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වලට බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සේවකයින් බඳවාගත් පාසල් කවරේද;

(iii) එම සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'10

7.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ප්‍රමාණවත් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0475/'10

8\.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අවසන් වරට පළාත් පාලන මැතිවරණ පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද සභා සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද සභා කවරේද;

(v) ඒවා අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධුරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජනය කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළඹී ඇති නිගමනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0717/'10

9\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1994 සිට මේ දක්වා කටුනායක ගුවන්තොටුපලේ තිබෙන තීරුබදු රහිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් තීරුබදු රහිත වෙළෙඳසැල් ලබා දී ඇති හෝ බදු දී ඇති පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සාප්පු සංකීර්ණ ලබා දී ඇති මුළු මුදල හෝ ස්ථිර වශයෙන් පවරා දීමට රජය ලබා ගත් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කටුනායක ගුවන්තොටුපල තුළ නව සාප්පු සංකීර්ණයක් ඉදි කිරීම සඳහා කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එය ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ යටතේ ඉදිකිරීමට අපේක්ෂිත වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0801/'10

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජය මගින් පාලනය වන ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එම පාසල් අතරින් ගුරු අතිරික්තයක් පවතින පාසල් කවරේද;

(iv) ගුරු අතිරික්තයක් පවතින විෂයයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම පාසල්වලින් ගුරු ඌනතා පවතින පාසල් කවරේද;

(ii) ගුරු ඌනතාවයන් පවතින විෂයයන් කවරේද;

(iii) ගුරු ඌනතා පවතින පාසල්වලට ගුරුවරුන් ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0969/'10

11.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටතේ ජලය ලබා දෙන ප්‍රදේශ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ දඹුල්ල හරහා මී ඔය ඔස්සේ යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ගෙන ඒමට සැළසුම් කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ලබා දීමට වෙනත් ක්‍රමවේදයක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1027/'10

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම සිසු පරපුරට පාසල් පවත්වන සෑම දිනකම දිවා ආහාර වේලක් ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0476/’10

13.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ 10ක කාලය තුළ එක් එක් වර්ෂයේදී සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කරනු ලැබූ දිනයන් සහ ප්‍රමාණයන් කවරේද;

(ii) සිගරට් සහ මධ්‍යසාරවල මිල වැඩි කළ එම එක් එක් අවස්ථාවේදී පෙර පැවැති මිලට වඩා වැඩියෙන් නියම කළ මිල ගණන් හේතුවෙන් උපයාගත් සමස්ත ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිල වැඩි කිරීම මගින් සිගරට් හා මධ්‍යසාර භාවිතය අධෛර්යමත් කිරීමට රජය උනන්දුවක් දක්වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සිගරට් සහ මධ්‍යසාර සඳහා පනවා ඇති සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0727/’10

14.

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්තවාන, ගොරකදෙණිය මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාරදුන් ආයතනය හෝ පුද්ගලයින් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද ;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදුකළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බව සහ නියමිත දුර ප්‍රමාණය නොමැති බව එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයින් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1028/’10

15.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වලින් අධ්‍යාපනය ලබන සිසු පරපුරේ පෝෂණ තත්ත්වය කවරේද;

(ii) එම පාසල් දරුවන් අතරින් මන්දපෝෂණයෙන් පෙළෙන දරුවන්ගේ ප්‍රතිශතය කවරේද;

(iii) පාසල් දරුවන්ගේ මන්දපෝෂණ තත්ත්වය නැති කිරීමට රජය ගන්නා වූ ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම ක්‍රියාමාර්ග පාසල් දරුවන්ගේ මන්දපෝෂණය නැති කිරීමට ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන),— 1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

ගරු වික්ටර් ඇන්ටනි මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*6.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියමය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 මාර්තු 09 දිනැති අංක 1696/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා,— සත්ව පනත යටතේ නියමය,— 1958 අංක 29 දරන සත්ව පනතේ 3, 3අඅ, 11, 26 හා 34 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ පශු සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 නොවැම්බර් 26 දිනැති අංක 1629/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.04.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*13.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

14.

පුරාවස්තු සුරැකීමේ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15.

සීමාසහිත ශ්‍රී විද්‍යාවාස සමාජසේවා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

පහලගම ශ්‍රී සෝමරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යානවිද්‍යා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

අතරගල්ල එක්සත් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

23.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව)(සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

24.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**